134

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2007

**පරිපාලන නීතිය – LWU 3311 / 4331**

කාලය - පැය තුනයි

---

දිනය: 2007 මාර්තු මස 16 වන දින          වේලාව: පෙ ව 1.30 ප. ව. 4.30 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. "පරිපාලන තීරණයකින් පීඩාවට පත් පුරවැසියෙකුට සහන ලබා දෙන ප්‍රතිපාදන බලය ලබා දෙන පණතේ නොමැතිවීම ඔහු අධිකරණවලින් සහන ඉල්ලා සිටීම වැළැක්වීමට හේතු නොවේ. මනාව පිළිගනු ලැබ ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලධර්ම මගින් පරිපාලන ක්‍රියා පිළිබඳ අධිකරණ සමාලෝචනය සඳහා අවශ්‍ය මූලික පදනම සැපයේ."

   අධිකරණ සමාලෝචනය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පදනම ඇසුරෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

2. මාර්ග සංවර්ධන අධිකාරිය වූකලී පාර්ලිමේන්තු පණතකින් ස්ථාපිත කරනු ලැබූ රාජ්‍ය ආයතනයකි. එයට වෙනත් කරුණු අතර ප්‍රධාන මාර්ග පුළුල් කිරීම හා යළි ඉදිකිරීම සඳහා බලතල ඇත. පනවිල සිට අවිස්සාවේල්ල දක්වා වූ ප්‍රධාන මාර්ගයේ කිලෝ මීටර් 10 ක දුර ප්‍රමාණයක් යළි ඉදි කිරීමේ කාර්යය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාරගෙන තිබුණි. පනවිල ප්‍රදේශයේ වැසියන්ට රෝහල්, පාසල්, පොලිස් ස්ථානය හා සිය සේවා ස්ථාන කරා ළඟා විය හැකි එකම මාර්ගය වූයේ මෙම මාර්ගයයි. පසුගිය වසර කිහිපය තිස්සේ මෙම මාර්ගය අලුත් වැඩියා නොකර තිබීම නිසා පොදු ප්‍රවාහන කටයුතුවල දී විශාල බාධාවක් ඇති වී තිබුණි. මෙම මාර්ගය භාවිත කිරීමට හැකි වූයේ ත්‍රී රෝද රථවලට හා ලොරිවලට පමණි.

   මාර්ගය අලුත්වැඩියා කර දෙන මෙන් ඉල්ලමින් පනවිල වැසියන් විසින් මාර්ග සංවර්ධන අධිකාරියට කිහිප වාරයක් ලිපි ඉදිරිපත් කර තිබුණි. එහෙත් මේ දක්වා මාර්ග සංවර්ධන අධිකාරිය ඒ සම්බන්ධයෙන් පියවර ගෙන නොමැත. මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව මේ සම්බන්ධයෙන් කිසියම් නෛතික පියවරක් ගත හැකි දැ යි පනවිල ප්‍රදේශවාසීහු ඔබෙන් විමසති.

   ඔවුනට උපදෙස් දෙන්න.

3. වික්ටර් රුරිටානියා විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ තුන්වන වසරේ ශිෂ්‍යයෙකි. එම පීඨයේ පළමු වසර සිසුවකුට නවක වදය දීම සම්බන්ධයෙන් 22.12.2006 වන දින ඔහුට විරුද්ධව නවක වදය දීමට එරෙහි පණත යටතේ චෝදනා නගා තිබුණි. සිද්ධිය දුටු ජෝෂප් ශිෂ්‍ය උපදේශකවරයා සාක්ෂිකරුවකු වශයෙන් ඉදිරිපත් විය. විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් මෙම කරුණ පිළිබඳව විභාග කිරීම සඳහා කමිටුවක් පත් කරනු ලැබිය. ජෝෂප් ශිෂ්‍ය

උපදේශකවරයා හා වෙනත් පීය දෙකක ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් කමිටුව සමන්විත විය. 26.01.2007 වන දින පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළ කමිටුව පරීක්ෂණය පවත්වන දිනට දින 3 කට පෙර චෝදනා පත්‍රය වික්ටර්ට තැපැල් කළේය. වික්ටර්ට චෝදනා පත්‍රය ලැබුණේ පරීක්ෂණ දිනයට පෙර දිනයේය. සිය විත්තිවාචක ඉදිරිපත් කිරීම සඳහා සූදානම්වීම පිණිස තමනට ප්‍රමාණවත් කාලයක් නොමැති හෙයින් පරීක්ෂණය පැවැත්වීම කල්දමන ලෙස වික්ටර් ඉල්ලා සිටියේය. කෙසේ වුව ද ඔහුගේ ඉල්ලීම කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

පරීක්ෂණය සඳහා නීතිඥ සහය ලබා ගැනීම සඳහා වික්ටර් කළ ඉල්ලීම ද කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. පරීක්ෂණය පැවැත්වෙමින් තිබිය දී සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීම සඳහා වික්ටර් අවසර ඉල්លූ නමුත් කමිටුව ඒ සඳහා අවසර නුදුන්නේය. පැය තුනක් තිස්සේ පරීක්ෂණය පවත්වන ලද අතර කමිටුව විසින් සිය තීරණය උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී. කමිටුවේ සොයා ගැනීම් මත පදනම් ව උපකුලපතිවරයා විසින් වික්ටර්ගේ පන්ති වසරකට තහනම් කරන ලදී.

උපකුලපතිවරයාගේ තීරණය පිළිබඳව අතෘප්තියට පත් වික්ටර් උපකුලපතිවරයාගේ තීරණය අධිකරණයක දී ප්‍රශ්න කළ හැකි දැයි ඔබෙන් විමසයි.

වික්ටර්ට උපදෙස් දෙන්න.

4. "ශ්‍රී ලංකා අධිකරණයේ මෑත කාලීන මතභේදාත්මක නඩු තීරණ හේතුකොටගෙන පරිපාලන ක්‍රියාවන්ට එරෙහි ප්‍රකාශන ආඥාවන් ලබා ගැනීම සම්බන්ධයෙන් අවිනිශ්චිතභාවයක් ඇති වී ඇත."

විනිශ්චිත නඩු තීරණ ඇසුරෙන් මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

5. ජාතික ආපදා වන්දි මණ්ඩලය පාර්ලිමේන්තු පණතකින් ස්ථාපිත ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. වෙනත් කරුණු අතර ස්වාභාවික ආපදාවලින් හානියට පත් ගොඩනැගිලි හා නිවාස යළි ඉදිකිරීම සඳහා වන්දි ගෙවීමේ බලතල මණ්ඩලයට ඇත. පණත යටතේ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන ස්වාභාවික ආපදා කළමණාකරණ කමිටුවේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව පමණක් වන්දි ගෙවීමට මණ්ඩලයට බලය ලබා දී ඇති බව පණතේ සඳහන් වේ. 'මණ්ඩලයේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කළ නොහැකිය' යනුවෙන් පණතේ එක් විධිවිධානයක සඳහන් වේ.

ගාල්ලේ වෙරළාසන්න ප්‍රදේශයක පිහිටි බැද්දේගම වැසියකු වන පෙරේරා මෑතක දී සිදු වූ ගංවතුරකින් හානියට පත් සිය නිවස යළි ඉදි කිරීම පිණිස වන්දි ලබා ගැනීම සඳහා අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළේය. කෙසේ වුව ද කමිටුවේ වාර්තාව ලබා ගැනීමෙන් පසුව මණ්ඩලයේ සභාපතිවරයා විසින් පෙරේරාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන ලදී. සභාපතිවරයා අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉදිරිපත් නොකළේය.

කෙසේ වුව ද කමිටුවේ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව මණ්ඩලයේ සභාපතිවරයාගේ පාසල් මිතුරෙකු වූ හා තම ගමේ වැසියකු වූ සිල්වාට මණ්ඩලය විසින් වන්දි ගෙවා ඇති බව

පෙරේරාට පසුව දැන ගන්නට ලැබුණි. තමාට ලබා ගත හැකි සහන මොනවාදැයි පෙරේරා ඔබෙන් විමසයි.

ඔහුට උපදෙස් දෙන්න.

6. සිය රට ආරක්ෂා කිරීම සඳහා යුධ වැදීමේ දී අඩු වශයෙන් එක් දෙමාපියෙකු හෝ මිය ගිය පුද්ගලයන්ට මාසික දීමනාවක් ලබා දී මේ ප්‍රතිපත්තියක් සුම්ලන්තයේ රජය විසින් හඳුන්වා දෙන ලදි. මේ සඳහා සුම්ලන්ත පාර්ලිමේන්තුව විසින් 2006 පවුල් ආධාර පණත පණවන ලදි. යුද්ධයේ දී එක් දෙමාපියකු හෝ අහිමි වන අවුරුදු 18 ට අඩු සෑම පුද්ගලයකුට ම ඩොලර් 200 ක මාසික දීමනාවක් හිමි වන බව පණතේ සඳහන් වේ. දීමනාවක් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබන පුද්ගලයා විසින් අයදුම්පත්‍රය පවුල් ආධාර මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර මණ්ඩලයේ සෑම තීරණයක්ම අවසානාත්මක හා තීරණාත්මක වන බවත් එය කිසිදු අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු බවත් පණතේ තවදුරටත් සඳහන් වේ.

යුද්ධයේ දී තමා හදාගත් දෙමාපියන් දෙදෙනා ම මිය ගිය මයිකල් පවුල් ආධාර මණ්ඩලයට අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළේය. විධිවිධානය අදාල වන්නේ යුද්ධයේ දී ස්වභාවික දෙමාපියන් දෙදෙනා මිය ගිය පුද්ගලයන්ට පමණක් බවට අර්ථ නිරූපණය කරමින් මයිකල්ට ප්‍රතිලාභ ගෙවීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදි. තමා නීත්‍යානුකූලව හදා ගත් දරුවකු බවත් එහෙයින් තමාට පණත යටතේ වන්දි ලබා ගැනීම සඳහා හිමිකම් ඇති බවත් මයිකල් කියා සිටියේය. කෙසේ වුව ද මණ්ඩලය කියා සිටියේ තම තීරණය අවසානාත්මක හා තීරණාත්මක බවයි. මණ්ඩලයේ තීරණය අධිකරණයක් හමුවේ ප්‍රශ්න කළ හැකි දැ යි මයිකල් ඔබෙන් විමසයි

සුම්ලන්තයේ අර්ථ නිරූපණ පණත 1972 අංක 18 දරණ අර්ථ නිරූපණ (සංශෝධන) පණතට සමාන බව උපකල්පනය කරමින් මයිකල්ට උපදෙස් දෙන්න.

7. (අ) වරාය කම්කරුවන්ගේ විනය කරුණු පිළිබඳ අනු නීති සකස් කිරීම සඳහා ෆ්‍රෝලන්තයේ ජාතික වරාය අධිකාරිය පණත මගින් වරාය අධිකාරියට බලය ලබා දෙයි අධිකාරියේ තීරණයක් පිළිබඳව අතෘප්තියට පත් පාර්ශවකරුවන්ට අධිකාරියේ තීරණය ප්‍රකාශයට පත්කොට දින 30 ක් ඇතුලත දී වරාය භාර ඇමතිවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව පණතේ විධිවිධානයක සඳහන් වේ.

සියලු අනාගත අභියාචනා වරාය අධිකාරිය විසින් ස්ථාපිත කරනු ලැබූ අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බව හා අභියාචනා මණ්ඩලයේ තීරණය අවසානාත්මක බව සඳහන් රෙගුලාසියක් වරාය අධිකාරිය විසින් පණවන ලදි. අධිකාරියේ සභාපතිවරයා විසින් වරාය කම්කරුවකු වූ ගෝර්ඩන් විෂමාචාරය මත සේවයෙන් පහ කරන ලදි අභියාචනා මණ්ඩලය වෙත කරන ලද අභියාචනය ද ප්‍රතික්ෂේප කරන ලදි. සභාපතිවරයාගේ තීරණය අභියෝගයට ලක් කළ හැකි දැයි ගෝර්ඩන් ඔබෙන් විමසයි

ගෝර්ඩන්ට උපදෙස් දෙන්න

(ආ) "පහසුව හා අවශ්‍යතාව හේතුකොටගෙන සිය කාර්යයන් පහළ මණ්ඩලවලට අභිනියෝජනය කිරීමට පොදු බලධාරීන්ට අවසර දිය යුතුය. කෙසේ වුව ද රාජ්‍යයේ

සුභසාධනය උදෙසා අභිනියෝජිත නිති අධිකරණයේ පාලනය යටතේ තබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

අදහස් දක්වන්න

8. "පරමාධිකාරි රිට් ආඥාවක් ඉල්ලා සිටින පෙත්සම්කරුවකුට අනිවාර්යයෙන්ම හා අයිතිවාසිකමක් වශයෙන් හා සාමාන්‍යයෙන් සිදු වන ආකාරයෙන් සහන ලබා ගැනීමට හිමිකම් නොලැබේ. ඔහුට සහන සඳහා හිමිකම් තිබුන විට පවා සහන ලබා දීමට එරෙහි වන වලංගු බාධකයන් වශයෙන් ක්‍රියාත්මක වන ඔහුගේ ක්‍රියාකලාපය, ප්‍රමාදය, නොසැලකිල්ල, අත්හැර දැමීම, අධිකරණ බලයට යටත් වීම සැලකිල්ලට ගනිමින් සිය අභිමතය පාවිච්චි කරමින් සහන ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට අධිකරණයට හැකිය."

විනිශ්චිත නඩු තීරණ ඇසුරෙන් මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

හිමිකම් ඇවිරිණි
*************